# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2431/36 – 2025 අප්‍රේල් මස 11 වැනි සිකුරාදා – 2025.04.11

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

5 වැනි වගන්තිය යටතේ ප්‍රකාශය

මෙහි පහත 1 ඡේදයේ විස්තර කරනු ලබන පරවශතාවය පොදු ජන කටයුත්තක් සඳහා අවශ්‍ය බවත්, එය ඉඩම් අත්කර ගැනීමේ පනතේ විධිවිධාන යටතේ අත්කර ගනු ලබන බවත්, ඉඩම් අත්කර ගැනීමේ පනතේ 5 වැනි වගන්තියේ (1) උප වගන්තිය යටතේ කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍ය කුරගමගේ දොන් ලාල් කාන්ත වන මම මෙයින් ප්‍රකාශ කරමි. එකී පරවශතාවය අත්කර ගනු ලබන්නේ කවර ඉඩමකින්ද යන්න 2 ඡේදයේ විස්තර වේ.

1. **පරවශතාවේ විස්තරය.–** කුණ්ඩසාලේ හාරගම ජල සම්පාදන ව්‍යාපෘතියේ කොළොන්ගස්වත්ත සේවා ජලාශයේ ප්‍රවේශ මාර්ගය නල එලීම හා නල මාර්ග නඩත්තු කිරීම සඳහා ඉඩම් කොටසක පරවශතා අයිතිය අත්කර ගැනීම.

2. **ඉඩමේ විස්තරය.–** මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ, කුණ්ඩසාලේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ඉහලවෙල (701) ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, උඩගම්පහ කෝරළේ සුළු කොට්ඨාසයේ, කෙන්ගල්ල ගමේ පිහිටි, සර්වේයර් ජනරාල් විසින් පිළියෙල කරන ලද අංක Maha/KND/2022/289 හා 2023.02.10 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සවිස්තරව දැක්වෙන පහත සඳහන් නම්වලින් හා ප්‍රමාණවලින් යුක්ත ඉඩම් කැබලිවලට මායිම්:

01. **කැබලි අක්ෂර ‘A’ – කොලොන්ගහවත්ත – ප්‍රමාණය: හෙක්. 0.0098 ක් පමණ**

උතුරට: ආර්. එම්. යූ. යූ. ඒ. රාජපක්ෂ හිමිකම් කියන කොලොන්ගහවත්ත; නැගෙනහිරට: ආර්. එම්. යූ. යූ. ඒ. රාජපක්ෂ හිමිකම් කියන කොලොන්ගහවත්ත සහ ආර්. මුත්තුලිංගම් හිමිකම් කියන කොලොන්ගහවත්ත; දකුණට: ආර්. මුත්තුලිංගම් හිමිකම් කියන කොලොන්ගහවත්ත සහ කැබලි අක්ෂර B; බටහිරට: කැබලි අක්ෂර B සහ ආර්. එම්. යූ. යූ. ඒ. රාජපක්ෂ හිමිකම් කියන කොලොන්ගහවත්ත.

02. **කැබලි අක්ෂර ‘B’ – ප්‍රමාණය: හෙක්. 0.013 ක් පමණ**

උතුරට: ආර්. එම්. යූ. යූ. ඒ. රාජපක්ෂ හිමිකම් කියන කොලොන්ගහවත්ත සහ කැබලි අක්ෂර A; නැගෙනහිරට: කැබලි අක්ෂර A සහ ආර්. මුත්තුලිංගම් හිමිකම් කියන කොලොන්ගහවත්ත; දකුණට: ආර්. මුත්තුලිංගම් හිමිකම් කියන කොලොන්ගහවත්ත සහ ප්‍රාදේශීය සභා මාර්ගය; බටහිරට: ප්‍රාදේශීය සභා මාර්ගය සහ ආර්. එම්. යූ. යූ. ඒ. රාජපක්ෂ හිමිකම් කියන කොලොන්ගහවත්ත.

කේ. ඩී. ලාල් කාන්ත,
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ
වාරිමාර්ග අමාත්‍ය.

මගේ අංකය: 4-3/18/2021/WS/169.
2025 ජනවාරි මස 24 වැනි දින.
කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යාංශය,
“මිහිකත මැදුර”,
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

EOG 04 – 0081

1A – G 044176 – 14 (2025/04)
ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*